මාධ්‍ය නිවේදනය
ஊடக வெளியீடு
PRESS RELEASE

Tel : 011 2 386572 Fax : 011 2 333717
ජනාධිපති මාධ්‍ය අංශය,ජනාධිපති කාර්යාලය,කොළඹ 01
ஜனாதிபதி ஊடகப் பிரிவு, ஜனாதிபதி அலுவலகம், கொழும்பு 01
President's Media Division, President's Office, Colombo 01

**Resumption of civilian life and office work begins from May 11**

While the curfew is in force in the districts of Colombo, Gampaha, Kalutara and Puttalam, the resumption of civilian life and state and private sector activities will begin from Monday, 11th May.

In order to ensure return to normalcy in civilian life and to revive the economy including continuous provision of essential services in these districts, both public and private sector entities should resume their work from Monday, 11th May. Heads of institutes are advised to make necessary arrangements taking into consideration of the required number of employees to run their organizations. Head of each entity should ensure strict adherence to the guidelines issued by the Director General of Health Services and other health authorities to control the spread of COVID – 19 virus while carrying out their operations.

The responsibility to decide who should come to office work and their number lies with head of the each state organization including Departments, Corporations and Boards. The private sector entities are requested to open for work at 10.00am daily.

As a measure to prevent the spread of the Coronavirus the public must refrain from unnecessarily coming to roads and gathering at various other places. Buses belonging to Sri Lanka Transport Board and railway carriages can only transport employees who are reporting for work.

Civilians except those who are essentially required to report to work are requested to remain in their homes. People are allowed to leave their homes only to purchase essential items such as food and medicines. Corona prevention health recommendations should strictly be followed at each instance. Curfew passes issued by the Police authorities are valid only if the driver and passengers wear facemasks.

Curfew in other districts of the island except in the districts of Colombo, Gampaha, Kalutara and Puttalam will only be effective from 8.00 pm to 5.00am everyday till Wednesday, the 06th of May.

The curfew which will be imposed at 8.00pm on Wednesday, the 06th of May will continue till 5.00am on May 11th.

Mohan Samaranayake

Director General (Media)

01.05.2020

Tel : 011 2 386572 Fax : 011 2 333717
ජනාධිපති මාධ්‍ය අංශය, ජනාධිපති කාර්යාලය, කොළඹ 01
ஜனாதிபதி ஊடகப் பிரிவு, ஜனாதிபதி அலுவலகம், கொழும்பு 01
President's Media Division, President's Office, Colombo 01

**How the resumption of civilian life progress while curfew is in force**

Further clarification

**01.What are the districts where the curfew is on and at what**

· Curfew will be effective in the districts of Colombo, Gampaha, Kalutara and Puttalam until further notice.

· In the rest of the districts curfew will be on from 8.00pm o 5.00 am from today (04) till Wednesday (06). Curfew which will be re-imposed in these districts at 8.00pm on Wednesday, May 6th will be in force till 5.00am on Monday, May 11th.

**02. When will the resumption of civilian life and office work begin while curfew is still in force?**

· While curfew is still in force civilian life in the distrits of Colombo, Gampaha, Kalutara and Puttalam will resume from Monday, the May 11th .

· Although, this plan was scheduled to be implemented from today, Monday, the May 4th, due to 04 holidays falling this week it was extended till Monday, May 11th.

**03. How do the primary functions relating to resumption of civilian life progress?**

· Both public and private sector entities in the districts of Colombo, Gampaha, Kalutara and Puttalam should re-commence their work from Monday, May 11th.

· Heads of each institute habe already had been instructed to work out a plan based on their requirements.

· Head of each entity should ensure strict adherence to the prescribed health guidelines issued to control the spread of COVID – 19 virus while carrying out their operations.

· The private sector entities are requested to open for work at 10.00am daily.

· The responsibility to decide who should come to office work and their number lies with head of the each organization.

· Buses belonging to Sri Lanka Transport Board and railway carriages can only transport employees of both public and private sectors who are reporting for work.

**04. For what purposes civilian can leave their homes during curfew hours?**

· Civilians except those who are essentially required to report to work are requested to remain in their homes as a measure to control the disease.

· People are allowed to leave their homes only to purchase essential items such as food and medicines.

**05. What are the areas where people are premitted to leave their homes based on the last digit of the NIC and from when?**

- Only in areas where the curfew is in force
- From Monday, May 11th
- This system does not apply to areas where the curfew is relaxed

The Government expects the public will refrain from gathering unnecessarily by following above guidelines even when the curfew is lifted.

Revival of the economy and the resumption of civilian life will take place while curfew regulations are effective and controlling unnecessary congregation of people as a measure to prevent the spread of the disease is a prime objective of this mechanism.

Conditions included in previous announcements regarding the above matter remain unchanged.

President's Media Division

04.05. 2020

Tel : 011 2 386572 Fax : 011 2 333717
ජනාධිපති මාධ්‍ය අංශය,ජනාධිපති කාර්යාලය,කොළඹ 01
ஜனாதிபதி ஊடகப் பிரிவு, ஜனாதிபதி அலுவலகம், கொழும்பு 01
President's Media Division, President's Office, Colombo 01

නිවේදන අංක - 89
2020-05-01 ප.ව 8.25

# *දෛනික ජන ජීවිතය සහ ආයතනික ක්‍රියාකාරිත්වය යථා තත්ත්වයට පත් කිරීම මැයි 11 වැනිදා ඇරඹෙයි.*

**කොළඹ, ගම්පහ, කළුතර සහ පුත්තලම දිස්ත්‍රික්කවල ඇඳිරි නීතිය තිබියදී ජන ජීවිතය සහ ආයතන ක්‍රියාකාරිත්වය යථා තත්වයට පත් කිරීම මැයි 11, සඳුදා ඇරඹෙයි.**

**මේ දිස්ත්‍රික්කවල අත්‍යාවශ්‍ය සේවා පවත්වා ගැනීම ඇතුළු ජනජීවිතය සහ ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීම පිණිස රාජ්‍ය, පෞද්ගලික දෙඅංශයේ ආයතන සඳුදා සිට විවෘත කොට පවත්වාගෙන යා යුතුය. සේවා අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් ඒ සඳහා අවශ්‍ය සැලසුම් දැන් සිටම සකස් කරන ලෙස ආයතන ප්‍රධානීන්ට දැනුම් දෙනු ලැබේ. ආයතන විවෘත කොට පවත්වාගෙන යාමේදී කොවිඩ් 19 වසංගතය පාලනය කිරීම සඳහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා ප්‍රමුඛ සෞඛ්‍ය බලධාරීන් නියම කර ඇති මාර්ගෝපදේශ මුළුමනින්ම පිළිපදින බවට ආයතන ප්‍රධානීන් වගබලාගත යුතුය.**

**දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල ඇතුළු රාජ්‍ය ආයතනවල සේවයට කැඳවිය යුතු සේවක සංඛ්‍යාව සහ සේවයට කැඳවන්නේ කුමන සේවකයන්ද යන්න ආයතන ප්‍රධානියාගේ අභිමතය අනුව තීරණය කිරීමට පිළිවන. පෞද්ගලික අංශයේ ආයතන විවෘත කළයුතු වේලාව උදේ 10.00 ලෙස නියම කර තිබේ.**

**වෛරස ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා ජනයා අනවශ්‍ය ලෙස මහාමාර්ගයට පැමිණීම සහ වෙනත් ස්ථානවල එක්රැස්වීම නතර කළයුතුව ඇත. ගමනාගමන මණ්ඩල බස්රථවල සහ දුම්රිය මැදිරිවල මගී ප්‍රවාහනය රැකියා සඳහා යන එන අයට පමණක් සීමා කෙරේ.**

**අවශ්‍යයෙන්ම සේවයට වාර්තා කළයුතු අය හැර සෙසු ජනයාගෙන් රෝග නිවාරණයට සහාය වනු පිණිස නිවෙස්වලම රැඳී සිටින්නැයි ඉල්ලීමක් කෙරේ. කවරකු හෝ නිවසින් බැහැර යා යුත්තේ ආහාර හා ඖෂධ වැනි අත්‍යාවශ්‍ය භාණ්ඩ හා ද්‍රව්‍ය මිලට ගැනීමට පමණි. මේ සෑම අවස්ථාවකම කොරෝනා පාලන සෞඛ්‍ය නිර්දේශ අකුරටම පිළිපැදිය යුතුය. පොලිස් බලධාරීන් විසින් නිකුත් කර ඇති ඇඳිරි නීති බලපත් වලංගුවන්නේ රියැදුරු සහ රථයේ ගමන් කරන අය මුඛ ආවරණ පැළඳ සිටින්නේනම් පමණි.**

**කොළඹ, කළුතර, ගම්පහ සහ පුත්තලම දිස්ත්‍රික්ක හැර සෙසු දිස්ත්‍රික්කවල ඇඳිරිනීතිය මැයි 06, බදාදා දක්වා ක්‍රියාත්මක වනුයේ කලින් පරිදි රාත්‍රී 8.00 සිට අලුයම 5.00 දක්වාය.**

**මේ දිස්ත්‍රික්කවල මැයි 06, බදාදා රාත්‍රී 8.00ට පනවනු ලබන ඇඳිරි නීතිය මැයි 11 සඳුදා අලුයම 5.00 දක්වා දිගටම ක්‍රියාත්මකව පවතී.**

මොහාන් සමරනායක
අධ්‍යක්ෂ ජනරාල්
ජනාධිපති මාධ්‍ය අංශය
2020-05-01

මාධ්‍ය නිවේදනය
ஊடக வெளியீடு
PRESS RELEASE

Tel : 011 2 386572 Fax : 011 2 333717
ජනාධිපති මාධ්‍ය අංශය,ජනාධිපති කාර්යාලය,කොළඹ 01
ஜனாதிபதி ஊடகப் பிரிவு, ஜனாதிபதி அலுவலகம், கொழும்பு 01
President's Media Division, President's Office, Colombo 01

නිවේදන අංක - **93**
**2020-05-04** ප.ව **5.10** ට

# ඇඳිරි නීතිය තිබියදී ජන ජීවිතය යථා තත්වයට පත් කිරීම සිදු වන්නේ කෙසේ ද ?

<u>වැඩිදුර පැහැදිළි කිරීම.</u>

**01-ඇඳිරි නීතිය ක්‍රියාත්මක වන්නේ කුමන දිස්ත්‍රික්කවල කුමන වේලාවන්හි ද ?**

- ✓ කොළඹ, ගම්පහ, කළුතර සහ පුත්තලම දිස්ත්‍රික්කවල නැවත දැනුම් දෙන තුරු ඇඳිරි නීතිය ක්‍රියාත්මකව පවතී.
- ✓ සෙසු දිස්ත්‍රික්කවල අද (04) සිට මැයි 06, බදාදා තෙක් රාත්‍රී 8.00 සිට අලුයම 5.00 දක්වා. මෙ දිස්ත්‍රික්කවල මැයි 06 බදාදා, රාත්‍රී 8.00 ට පනවනු ලබන ඇඳිරි නීතිය මැයි 11 සඳුදා අලුයම 5.00 දක්වා බලපවත්වයි.

**02-ඇඳිරි නීතිය තිබියදී ජන ජීවිතය සහ ආයතනික ක්‍රියාකාරීත්වය යථා තත්වයට පත් කිරීම පටන් ගන්නේ කවදා ද ?**

- ✓ කොළඹ, ගම්පහ, කළුතර සහ පුත්තලම දිස්ත්‍රික්කවල ඇඳිරි නීතිය තිබියදී ජන ජීවිතය යථා තත්වයට පත් කිරීම ආරම්භ වන්නේ මැයි 11 සඳුදා සිට,
- ✓ මෙ වැඩපිළිවෙළ අද (04) සිට ආරම්භ කිරීමට කලින් සැලසුම් කළද මෙ සතියේ නිවාඩු දින 04 ක් යෙදී තිබීම නිසා මැයි 11 ට වෙනස් කෙරිණ.

**03- ජන ජීවිතය යථා තත්ත්වයට පත් කිරීමේ මූලික කාර්යයන් සිදු වන්නේ කෙළෙස ද?**

- ✓ කොළඹ, ගම්පහ, කළුතර හා පුත්තලම දිස්ත්‍රික්කවල රාජ්‍ය, පෞද්ගලික දෙඅංශයේ ආයතන මැයි 11 සඳුදා සිට විවෘත කොට පවත්වාගෙන යා යුතුය.
- ✓ ඒ සඳහා දැන් සිටම සැලසුම් සකසන ලෙස ආයතන ප්‍රධානීන්ට දැනුම් දී ඇත.
- ✓ ආයතන විවෘත කොට පවත්වාගෙන යාමේ දී කොරෝනා වෛරසය පාලනය සඳහා නිර්දේශිත සෞඛ්‍ය මාර්ගෝපදේශ මුළුමනින් පිළිපදින බවට ආයතන ප්‍රධානීන් වගබලාගත යුතුය.
- ✓ පෞද්ගලික අංශයේ ආයතන උදේ 10.00 ට විවෘත කළ යුතු බව නියම කර ඇත.
- ✓ දෙඅංශයේම ආයතනවල සේවයට කැඳවන සේවකයන් සංඛ්‍යාව ආදිය තීරණය කිරීම ආයතන ප්‍රධානීන්ට පැවරේ.
- ✓ ගමනා ගමන මණ්ඩල බස් රථවල හා දුම්රිය මැදිරිවල මගී ප්‍රවාහනය රාජ්‍ය, පෞද්ගලික දෙඅංශයේ රැකියා සඳහා යන අයට සීමා කෙරේ.

**04-ඇඳිරි නීතිය තිබියදී නිවෙස්වලින් බැහැර යාමට අවසර ඇත්තේ කුමන කාර්යයන් සඳහා ද ?**

- ✓ අවශ්‍යයෙන්ම සේවයට වාර්තා කළයුතු අය හැර සෙසු ජනයා රෝග නිවාරණයට සහාය වනු පිණිස නිවෙස්වලම රැඳී සිටින්නැයි ඉල්ලීමක් කෙරේ.
- ✓ නිවසින් බැහැර යා යුත්තේ ආහාර සහ ඖෂධ වැනි අත්‍යාවශ්‍ය භාණ්ඩ හා ද්‍රව්‍ය මිලට ගැනීමට පමණි.

**05-ජාතික හැඳුනුම්පතේ අවසාන අංකය අනුව නිවසින් බැහැර යාමට දෙන අවසරය අදාළ වන්නේ කුමන ප්‍රදේශවලට ද ? කවදා සිට ද ?**

- ✓ ඇඳිරි නීතිය ක්‍රියාත්මක ප්‍රදේශවලට පමණි.
- ✓ මැයි 11 සඳුදා සිට
- ✓ ඇඳිරි නීතිය ලිහිල් කළ විට එය අදාළ නැත.

ඇඳිරි නීතිය ලිහිල් කළද ඉහත උපදෙස් පිළිපදිමින් ජනයා අනවශ්‍ය ලෙස ඒකරාශී වීමෙන් වැළකී සිටිනු ඇතැයි රජය අපේක්ෂා කරයි.

ඇඳිරි නීතිය තිබියදී, ආර්ථික සහ ජන ජීවිතය යථා තත්වයට පත් කිරීම සිදුවන අතර වෛරස ව්‍යාප්තිය වළක්වා ගනු පිණිස ජනයා ඒකරාශීවීම පාලනය කිරීම මේ විධිවිධාන වල ප්‍රධාන අරමුණකි.

උක්ත වැඩපිළිවෙළ සම්බන්ධයෙන් කලින් නිවේදනවල ඇතුළත් කොන්දේසි නොවෙනස්ව පවතී.

**ජනාධිපති මාධ්‍ය අංශය**

**2020-05-04**